## 18. ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

-----------------------------------------------------------------------------------------------

### 18.1 විගණන විෂය පථය

--------------------

ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 30 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 18.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 18.3 විගණන නිරීක්ෂණය

-----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ විසර්ජන ගිණුම මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 18.4 සිට 18.6

දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

වැය විෂයයන් 06 ක් සඳහා රු.2,259,500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.1,716,608 ක් උපයෝජනය කර තිබූ අතර ඉතිරිය රු.542,892 ක් විය. එක් එක් වැය විෂයය යටතේ ඉතිරි වූ මුදල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 63 දක්වා පරාසයක විය.

**(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් මූලධන ප්‍රතිපාදනවලින් සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, කාර්යාලය විසින් මූලධන ප්‍රතිපාදනවලින් ඉතිරි කර තිබුණේ සියයට 5 ක ප්‍රතිශතයකි.

## 18.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 18.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි

### 18.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි.

**18.5 අනුකූල නොවීම්**

මුදල් රෙගුලාසි 231 (1) (11) විධිවිධාන ප්‍රකාරව රු.22,515 ක් වූ ගෙවීම තහවුරු කිරීමට අවශ්‍ය ලියකියවිලි කිසිවක් නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි.

**18.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 2 | - |
| (ආ) | තෘතියික මට්ටම | 8 | 7 | 1 |
| (ඇ) | ද්විතියක මට්ටම | 15 | 11 | 4 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 17 | 17 | - |
| (ඉ) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 1 | 1 | - |
| | එකතුව | 43 | 38 | 5 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 05 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.